**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊය ඉන්දීය අගමැතිවරයා මරා දැමීම පිලිබඳව 'කනගාටුව' පල කරයි

**LTTE expresses "regret" over killing of Indian prime minister**

**සරත් කුමාර විසිනි**

**2006 ජුලි 13**

දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් ඉන්දීය එන්ඩීටීවී රූපවාහිනී චැනලය සමග ජූනි 27 දා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක දී හිටපු ඉන්දීය අගමැති රජීව් ගාන්ධිගේ ඝාතනයට තම සංවිධානය වගකිව යුතු බවට ප්‍රථම වරට ප්‍රසිද්ධියේ පිලිගත්තේ ය. ශ්‍රී ලංකාව නැවත සිවිල් යුද්ධය කරා තල්ලු වෙමින් පවතින තතු තුල ඔහු කල මෙම අනියම් සමාව ගැනීම වනාහි එල්ටීටීඊයේ ජාත්‍යන්තර හුදකලාව නැති කර ගැනීමට දූරූ මංමුලා සහගත ප්‍රයත්නයකි.

1991 මැයි මාසයේ ජාතික මැතිවරන සමයේ දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ප්‍රචාරක කටයුතුවල යෙදෙමින් සිටි රජීව් ගාන්ධිව කාන්තා සියදිවි නසා ගන්නා බෝම්බකාරිනියක් විසින් ඝාතනය කරන ලදි. සියදිවි නසා ගන්නා බෝම්බ වනාහි බොහෝ කලක පටන් එල්ටීටීඊයේ අනන්‍ය කාරකය යි. මේ සම්බන්ධ වගකීම භාරගැනීමක් එල්ටීටීඊ නායකත්වය කිසි දිනක නො කල අතරේ ඝාතනය පුලුල්ව සලකනු ලැබුවේ 1987 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ එල්ටීටීඊය බලයෙන් මැඩීමට ඉන්දීය සාම සාධක හමුදා එවමින් ගාන්ධි කල "පාවාදීමට" පලි ගැනීමක් ලෙසයි.

තම අදහස් දැක්වීම්වල දී බාලසිංහම් කියා සිටියේ ගාන්ධි ඝාතනය "බරපතල, අමතක නොවන ඓතිහාසික ඛේදවාචකයක්" බවත් එල්ටීටීඊ නායකත්වය "අතිශයින් ම කනගාටු වන" බවත් ය. ඉන්දීය ආන්ඩුවට ඖදාර්යවත් වී අතීතය පසෙකට දමා" එම ඝාතනය "ඉන්දියාවේ මිලිටරි මැදිහත් වීමේ සහ ඉන්දීය සාම සාධක හමුදා හා එල්ටීටීඊය අතර පැවති යුද්ධයේ දේශපාලනික සහ ඓතිහාසික සන්දර්භය තුල තබා" සලකන ලෙසත් ඔහු ආයාචනා කලේ ය.

බාලසිංහම් පෙන්නුම් කිරීමට අසමත් වූයේ දෙමල ඊලම්හි වෙනම රාජ්‍යයක් සඳහා වන එල්ටීටීඊයේ අභිලාෂයට නව දිල්ලිය පක්ෂපාතී වේ යයි කල්පනා කරමින් එල්ටීටීඊය ඉන්දු-ලංකා ගිවිසුමට සහ ඉන්දීය හමුදා එවීමට එකඟත්වය පල කල බවයි. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ කොලඹ ආන්ඩුවට පීඩනය දැමීමේ උපක්‍රමයක් ලෙස සලකා ඉන්දියාව ලංකාවේ සන්නද්ධ දෙමල සංවිධානවලට වක්‍රව සහයෝගය දුනි. සීතල යුද්ධය සන්දර්භය තුල නව දිල්ලිය සෝවියට් සංගමය සමග සමීප සබඳතා පවත්වා ගෙන ගිය අතර ජයවර්ධන එක්සත් ජනපදයේ සමීප සහකරුවකු විය.

කෙසේ වෙතත් දකුනු ඉන්දියාවේ දෙමල ජාතිකවාදී මනෝගතීන්ට තෙල් දමනු ඇත්තාවූ ශ්‍රී ලංකාවේ වෙනම දෙමල රාජ්‍ය කැබලිත්තකට අනුකූලතාව දැක්වීමට ඉන්දියාව සූදානම් වූවා නො වේ. ඉන්දීය "සාම සාධකයෝ" ජයවර්ධන ආන්ඩුව සමග ගිවිසුමේ කොටසක් ලෙස එල්ටීටීඊය නිරායුධ කිරීමට කටයුතු කරද්දී ප්‍රචන්ඩ සටන් ඇවිලී ගියේ ය. බාලසිංහම් තරමක් දුබල ආකාරයකින් විස්තර කල පරිදි: "අප ජනතාවගේ දේශපාලන අභිලාෂයන් තෘප්තිමත් නො කල නිසා ඉන්දියාව විසින් යෝජනා කල දේශපාලන විසඳුම් සමග අපි එකඟ නො වූයෙමු."

"ඉන්දියානු අධිරාජ්‍යවාදී" ආක්‍රමනයට විරුද්ධ යයි කියමින් ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) දියත් කල සිංහල අන්තවාදී උද්ඝෝෂනයේ පීඩනය යටතේ කොලඹ ආන්ඩුව කල උපාමාරු දැමීමක තතු තුල අවසානයේ දී ඉන්දීය සාම සාධකයන්ට පිටව යාමට බල කෙරුනි. ජවිපෙට එරෙහිව පමනක් නොව රැකියා විරහිත සිංහල තරුනයන් අතර පැතිර පැවති අසහනකාරීත්වය තලා දැමීමට ද අගමැති රනසිංහ ප්‍රේමදාස අවසානයේ දී සන්නද්ධ හමුදා මුදා හැරියේ ය. 60,000ක් පමන මරා දමනු හෝ "අතුරුදන් කරනු" ලැබුනි යි තක්සේරු වී ඇත. දකුනේ විභවාත්මක කැරැල්ල මර්දනය කල ප්‍රේමදාස ඉන්දියාවට තම හමුදා ඉවත් කර ගන්නා ලෙස කියා සිටි අතර ශ්‍රී ලංකා මිලිටරිය සහ එල්ටීටීඊය අතර සටන් යලි ක්ෂනිකව ඇරඹුනි.

සමස්ත සිද්ධි දාමය ම ඉස්මතු කර දැක්වූයේ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ධනපති රාජ්‍ය කැබලිත්තක් ස්ථාපනය කිරීම සඳහා ඒ හෝ මේ ප්‍රධාන බලයක පිටුබලය සොයන එල්ටීටීඊ ඉදිරි දර්ශනයේ බංකොලොත්භාවය යි. ශිෂ්ට සම්පන්න ජීවන කොන්දේසි හා වාර්ගික වෙනස්කම් අවසානයකට

ගෙන ඒම සඳහා වන දෙමල ජනතාවගේ අභිලාෂයන් පිලිබිඹු කිරීම වෙනුවට එල්ටීටීඊයේ වැඩ පිලිවෙල නියෝජනය කලේ කම්කරු පන්තිය සූරාකෑම සඳහා වාහකය ලෙස තමන්ගේ ම රාජ්‍යය දැක ගන්නා දෙමල ධනපති පන්තියේ උවමනාවන් ය.

ගාන්ධි මරා දැමීම මගින් එල්ටීටීඊය බෙලහීන ලෙස හෝ පහර දුන්නේ දෙමල ඊලම ස්ථාපනය කිරීමට පිටුබලය දීමට අසමත් වීම පිලිබඳව ඉන්දීය පාලක පන්තියට යි. මීට පෙර එල්ටීටීඊය මෙම ඝාතනය පිලිබඳ වගකීම භාරගැනීමට සූදානම් වූ සමීපතම අවස්ථාව වන්නේ එය ශ්‍රී ලංකාවේ ආන්ඩුව සමග සටන් විරාමයක් අත්සන් කිරීමෙන් පසුව 2002 දී පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවකි. ඍජුව එල්ලවුනු ප්‍රශ්නයක් මග හරිමින් බාලසිංහම් සහ එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන් එම ඝාතනය විස්තර කලේ අතීතයට අයත් දෙයක් හා ඛේදවාචකයක් ලෙස යි.

කෙසේ වුවද 2002 සටන් විරාමය ද තවත් දේශපාලනික අවෘත අන්තයක් බව තහවුරු විය. වෙනම දෙමල ඊලමක් සඳහා වූ තම ඉල්ලීම නිල වසයෙන් අත්හල එල්ටීටීඊය ආන්ඩුව සමග බලය බෙදා ගැනීමේ ගිවිසුමකට එලඹීමට කැමැත්ත පල කලේ ය. එහෙත් දිග් ගැස්සුනු සිවිල් යුද්ධය අවසානයකට ගෙන ඒම පිලිබඳ කිසිදු සාකච්ඡාවකින් තොරව 2003 දී සාකච්ඡා බිඳ වැටුනි. වාර්ගික දේශපාලනයේ පතුලට ම ගිලී සිටින කොලඹ ආන්ඩුව එල්ටීටීඊයට දෙන ඕනෑම සහනයක් පාවා දීමක් ලෙස සලකන ජවිපෙ වැනි ස්වෝත්තමවාදී පක්ෂවල උද්ඝෝෂනයන්ට හිස නැමූහ.

එල්ටීටීඊය වඩවඩාත් මුලුගන්වනු ලැබ ඇත. පසු ගිය නොවැම්බරයේ බලයට පැමිනි තැන් පටන් ජවිපෙ සහයෝගය මත රැඳී සිටින ආන්ඩුවක් සහිත ජනාධිපති මහින්ද රාජපක්ෂ, එල්ටීටීඊය හා සහායක අතිරේක හමුදා සහිත හමුදාව අතර දිගහැරෙන ඝට්ටනයට තෙල් දමා ඇත. තව ද එල්ටීටීඊය තමන් "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස නම් කොට ජාත්‍යන්තරව තහනම් කිරීම සඳහා වොෂින්ටනය ගෙන යන උද්ඝෝෂනයකට මුහුන දී සිටියි. යුරෝපයේ පිටුවහලේ සිටින දෙමල ප්‍රජාවගෙන් ලැබෙන අරමුදල් සහ දේශපාලන සහයෝගය අත් හිටුවමින් මෑතක දී කැනඩාව හා යුරෝපා සංගමය එක්සත් ජනපද පීඩනය යටතේ එල්ටීටීඊය තහනම් කලේ ය.

ගාන්ධි ඝාතනය පිලිබඳ බාලසිංහම් පල කල ප්‍රකාශය ඉන්දියාව වෙතට රාජ්‍ය තාන්ත්‍රික නාලිකා විවෘත කිරීමේ පැහැදිලි ප්‍රයත්නයකි. ඝාතනයෙන් පසුව නව දිල්ලිය, එල්ටීටීඊය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස නම් කල අතර එල්ටීටීඊයෙන් තහනම ඉවත් කරන ලෙස කෙරෙන ආයාචනයන් මධ්‍යයේ වුව එම තහනම දිගටම පවත්වා ගෙන යයි. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයට ඉදිරිපත් කෙරෙන විසඳුමක කොටසක් ලෙස වෙන ම දෙමල රාජ්‍යයක් බිහි කිරීමට ඇති විරුද්ධත්වය 1987 දී මෙන් ම නැවත නැවතත් පල කිරීමට ඉන්දීය ආන්ඩුව කටයුතු කර ඇත.

පිලිකුල් සහගත වැඳ වැටීමක් ප්‍රදර්ශනය කරමින් තමන් නැවත කිසි දිනක 1991 අත් දැකීම පුනරාවර්තනය නො කරන බව ඉන්දියාවට සහතික වීමට බාලසිංහම් දැඩි ලෙස උත්සාහ දැරී ය. "යලි කිසිදු හේතුවක් අරබයා අප ඉන්දීය ආන්ඩුවේ අවශ්‍යතාවන්ට එරෙහිව කටයුතු නොකරන බවත් රජීව් ගාන්ධි ඝාතනයේ පටන් ඉන්දියාව අපක්ෂපාත භූමිකාවක් ඉටු කල යුතු බවත් අපි පොරොන්දු වී ඇත්තෙමු. අපගේ හැඟීම වන්නේ ඉන්දියාව සාම ක්‍රියාවලියට ක්‍රියාකාරීව සහභාගි විය යුතු බවයි."

ඉන්දියාව එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස සලකා තහනම දිගටම පවත්වාගෙන යන තතු තුල මැදිහත්කාරී ක්‍රියාකාරිත්වයක් කිරීම අසීරු බව බාලසිංහම් පෙන්වා දුන්නේ ය. පහත සඳහන් දෑ කියමින් කොලඹට බලපෑම් කරන ලෙස ඔහු නව දිල්ලියෙන් අයැදී යː "(දැන්) ඉන්දියාවට කල හැකි එකම දෙය වන්නේ සාකච්ඡාමය විසඳුමක් සඳහා ශ්‍රී ලංකාව සහ එල්ටීටීඊය පෙලඹවීමට රාජ්‍යතාන්ත්‍රිකව හා දේශපාලනිකව කටයුතු කිරීම යි."

ඉන්දියාවේ ප්‍රතිචාරය අතුල්පහරකට සමාන විය. අභ්‍යන්තර කටයුතු පිලිබඳ රාජ්‍ය ඇමති ආනන්ද් ෂර්මා මාධ්‍යයන් වෙත කීවේ බාලසිංහම්ගේ සමාව අයැදීම පිලිගැනීම "ත්‍රස්තයේ, ප්‍රචන්ඩත්වයේ සහ දේශපාලන ඝාතනයේ දර්ශනය අනුමත කිරීමකට සමාන වනු ඇති බවයි." ඉන්දියාව කිසිදු සහනයක් නො දෙනු ඇතැයි ඉගි කරමින් ඔහු තව දුරටත් කීවේː "ඤකොටින්ඍ විසින් කල බියගුලු අපරාධයට සමාව දීම ඉන්දීය ජනතාවට කල නොහැක."

ඉන්දියාව ශ්‍රී ලංකා මිලිටරිය සමග සහයෝගිතාව වර්ධනය කරමින් සිටියි. මෑතක දී රේඩාර් පද්ධති දෙකක් ප්‍රදානය කල එය ඉන්දියාවේ පුහුනුව ලැබීම සඳහා ශ්‍රී ලාංකික මිලිටරි සාමාජිකයන්ට ඇති ස්ථාන සංඛ්‍යාව ඉහල දැමී ය.

බාලසිංහම්ගේ ප්‍රකාශයන්ට ශ්‍රී ලංකා ආන්ඩුව ප්‍රතිචාර දැක්වූයේ නැවත වතාවක් එල්ටීටීඊය හෙලා දකිමිනි. ප්‍රකාශක අනුර ප්‍රියදර්ශන යාපා ප්‍රකාශ කල පරිදිː "නිසැකයෙන්ම එල්ටීටීඊයේ වැඩ කටයුතු වන්නේ ශ්‍රී ලංකාවේ නායකයින්, විශේෂයෙන් ම දෙමල ප්‍රජාව අතරින් පැමිනි දේශපාලන පෞරුෂයන් ගිනිය නොහැකි සංඛ්‍යාවක් ඝාතනය කිරීම හෝ ඝාතනය කිරීමට තැත් කිරීමත් අහිංසක සිවිල් වැසියන් මරා දැමීමත් ය."

ජාත්‍යන්තර සහයෝගය රඳවා තබා ගැනීම සඳහා රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු එල්ටීටීඊය සමග සාම

සාකච්ඡා යලි ඇරඹීමට එකඟවීමක් ප්‍රදර්ශනය කරති. එහෙත් බාලසිංහම්ගේ ආයාචනයට කොලඹ ආන්ඩුව දක්වා ඇති ප්‍රතිචාරය මගින් පෙන්නුම් කරන්නේ, එය අව්‍යාජ සාකච්ඡා සඳහා යෝජනා ගෙන එනවා වෙනුවට ඉන්දියාව, එක්සත් ජනපදය සහ අනෙකුත් බලවතුන්ගේ නිහඬ පිටුබලය ද සහිතව රට නැවත මහා පරිමාන යුද්ධය සඳහා සූදානම් කරමින් සිටින බවයි.

© www.wsws.org